නුවරඑළිය මහා නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දින ද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජූලි 17 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නුවරඑළිය මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ ප්‍රමිත හා ප්‍රතිපත්ති.

සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කර ඇති බව දක්වා තිබූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01ට අනුව 2012 වර්ෂයේ ජනවාරි 01 දිනට පෙර පැවති ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.91,866,457ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.65,478,234 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය. | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය. |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i). වරිපනම් හා බදු | 99,931 | 39,990 | 59,941 |
| (ii). බදු කුළී | 41,954 | 15,093 | 26,861 |
| (iii). බලපත්‍ර ගාස්තු | 7,307 | 5,464 | 1,843 |
| (iv). වෙනත් ආදායම් | 59,008 | 41,358 | 17,650 |

2.2.2 වරිපනම් බදු

(අ) 2008 වර්ෂයේ සිදුකරන ලද වරිපනම් තක්සේරුවෙන් අනතුරුව සභාව විසින් අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 297 කට අදාළව නියමිත පරිදි ඉදිකිරීම් සිදු කිරීමෙන් පසු අනුකූලතා සහතික ලබාගෙන තිබුණේ ඉදිකිරීම් 36කට අදාළව පමණි. සෙසු ඉදිකිරීම් 261 ට අදාළව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණ වලදී බොහෝ ගොඩනැගිලිවල සංචාරක ව්‍යාපාර පවත්වාගෙන යාම් සහ නේවාසික කටයුතු සඳහා භාවිතා කරමින් පැවති බව නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳව නියමිත පරිදි කටයුතු කර වරිපනම් ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු නොකිරීමෙන් සභාව වෙත අයවිය යුතු සැලකිය යුතු ආදායමක් අහිමිවී තිබුණි.

(ආ) ගොඩනැගිලි 261ට අදාළව නව ඉදිකිරීම් සිදුකිරීමෙන් පසු මහනගර සභා ආඥා පනතේ 237 (1) විධිවිධාන අනුව වරිපනම් තක්සේරු කර සංශෝධනය කර නොතිබුණි. අළුතින් ඉදිකළ ගොඩනැගිලි 07ක් සඳහා මහා නගර සභා ආඥාපනතේ 127 වගන්තියේ විධිවිධාන අනුව අනුකූලතා සහතික ලබාගැනීමෙන් තොරව පදිංචිවී තිබු බව විගණන නියැදි පරික්ෂණයේදී අනාවරණය විය.

2.2.3 බදු කුළී.

මධ්‍යම පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ 2009 අගෝස්තු 19 දිනැති අංක එන්ර්/ආර්පී/631 දරන ලිපිය මගින් නගර සභාව සතු කඩ කාමරවල කුලී තක්සේරුකර තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය පරිදි ඉහත තක්සේරුව අනුව කඩකාමර 416ක කුලී අයනොකර සහා අනුමැතිය මත තක්සේරු කුලියට වඩා අඩුකුලියක් අයකිරීම නිසා 2012 දෙසැම්බර් 31 දින වන විට මහා නගර සභා අරමුදලට රු. 41,362,500ක ආදායමක් අහිමිවී තිබුණි.

2.2.4 මස් විකිණීමේ වෙළඳ අයිතිය බදුදීම.

(අ) පොදු වෙළඳ පොළේ පිහිටි සභාව සතු එළහරක් මස් කඩ 02 ක් සහ කුකුළුමස් කඩ 02 ක් වෙන වෙනම ඒකක ලෙස ටෙන්ඩර් නොකැඳවීම හේතුවෙන් සභා බලප්‍රදේශය තුල මස් විකිණීමේ අයිතිය බදු දීම නිසියාකාරව සිදුවී නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ එළහරක් මස් විකිණීමේ වෙළඳ අයිතිය බදු දීමේදී, තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගෙන් ප්‍රමාණවත් සුරක්ෂණයක් ලබා නොගැනීම සහ ගිවිසුම් ප්‍රකාරව බදු මුදල් අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.135,500ක බදු කුලියක් අයකර ගැනීමට නොහැකිව පැවතුණි.

2.2.5 ඉඩම් විකිණීම මත 1% බැගින් බදු අයකිරීම.

සභා බලප්‍රදේශය තුල පිහිටි අක්කර 07 රූඩ් 03 ක් පමණවූ ඉඩමක් සංවර්ධනය කර නිවාස ඉදිකර විකිණීම සඳහා පෞද්ගලික සමාගමකට සභා අනුමැතිය දී තිබුණි. 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාර් පනත අනුව අමාත්‍යවරයා පැනවූ නියෝග පරිදි සභාව වෙත පැවරිය යුතු පර්චස් 97.7 ක භූමි ප්‍රමාණය ඔප්පුවක් මගින් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

මෙම ඉඩමේ බිම් කට්ටි 34 ක් අදාළ සමාගම විසින් රු.202,890,000 කට පෞද්ගලික බැංකුවක් වෙත උකස් කර නිවාස ඉදිකිරීම් සඳහා මුදල් ලබාගෙන තිබුණු අතර, එහි බිම් කට්ටි 04ක ඉදිකළ නිවාස 04ක් රු.126,200,000 කට විකුණා තිබුණි. එහෙත් මහා නගර සභා ආඥා පනතේ 247(ඉ) (1) හි සඳහන් විධිවිධාන අනුව ඉඩම් විකුණන අවස්ථාවේ එහි වාණිජ වටිනාකමින් 01%ක් බදු වශයෙන් අයකර ගත යුතු වුවද, ඒ අනුව අයකර ගැනීමට කටයුතු නොකර ආදායම් පරීක්ෂකවරයාගේ තක්සේරුව මත එම ඉඩම සඳහා පර්චසය රු.50,000 බැගින් තක්සේරුකර රු.696,943ක බද්දක් පමණක් අයකරගෙන තිබුණි. මේ හේතුවෙන් දළ වශයෙන් රු.3,000,000ක බදු මුදලක් සභාවට අහිමි වී තිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ බදු මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 346,754 |
| (ii) | මුද්දර ගාස්තු | 6,605,020 |

2.2.7 ජල ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ හිටි ජල ගාස්තු ශේෂය තුල අඩංගු විසන්ධි කර වර්ෂයක් ඉක්මවා තිබූ ජල සේවා 54කට අදාළ රු.1,136,797ක හිඟ හිටි ජල ගාස්තුවක්ද ඇතුළත්වී තිබුණි.

2.3 අධිභාර.

මහා නගර සභා ආඥා පනතේ ( 252 වන අධිකාරය) 226 (1) වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2012 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර අගය රු. 919,559 ක් විය.

2.4 අවිධිමත් ගනුදෙනු.

(අ). මහා නගර සභා ආඥාපනතේ 188 (1) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකරන ලද නිලධාරීන්ට සංග්‍රහ කිරීම සඳහා රු.55,645 ක්ද, මියගිය සහා සේවකයෙකුගේ අවමංගල්‍ය කටයුතු සඳහා රු.21,000 ක්ද සභා අරමුදලින් වැයකර තිබුණි.

(ආ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.3 ප්‍රකාරව 20% ක උපරිමයකට යටත්ව අත්තිකාරම් ගෙවිය හැකි වුවද, ඊට පටහැනිව සභාවට අයත් කැටපිලර් යන්ත්‍රයක් අළුත්වැඩියා කිරීම සඳහා ඊට අදාල ඇස්තමේන්තුගත මුදලින් 75% ක් ලෙස රු.2,636,530 ක් ගෙවීම් කර තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය.

2.5.1 වික්ටෝරියා ළමා උද්‍යානය තුල විදුලි දුම්රියක් ස්ථාපිත කිරීම.

වික්ටෝරියා ළමා උද්‍යානය තුල විදුලි දුම්රියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2011 වර්ෂයේ පුද්ගලික සමාගමක් වෙත අවස්ථා 08කදී රු.36,341,250 ක මුදලක් ගෙවා තිබුණි.
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 03 හි විධිවිධාන පරිදි හෝ මධ්‍යම පළාත් සභාවේ මුල්‍ය රීති 04 පරිදි විධිමත් අනුමත කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා 2011 ජූනි 07 දින පුවත්පත් දැන්වීමක් මගින් මිල කැඳවීම් කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා 2011 ජූලි 28 දින ගිවිසුමකට එළඹ තිබුණ ද, ව්‍යාපෘති වාර්තාව සභාව අනුමත කර තිබුණේ 2011 අගෝස්තු 01 දිනදිය.

(ඇ) මෙම ව්‍යාපෘතිය සඳහා මහා නගර සභා ආඥාපනතේ 40(අ) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

---

(ඈ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි (භාණ්ඩ හා වැඩ) අංක 2.14.1 ට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යොදාගත නොහැකි වුවද, ප්‍රසම්පාදන ලියවිලි අනුව මිල කැඳවා තිබුණේ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේය.

(ඉ) ගෙවන ලද රු. 36,341,250 තුල එහි ඉන්වොයිසි වටිනාකම, රේගු බදු, ප්‍රවාහන ගාස්තු සහ සාධාරණ ලාභාංතිකය ඉක්මවා (රු.17,979,535 ) ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

2.5.2 වික්ටෝරියා උද්‍යානයේ ස්ථාපිත කර තිබූ ග්‍රිෂ්ම නිවාසයේ වහලය ඉදිකිරිම.

---

වික්ටෝරියා උද්‍යානය තුල ස්ථාපිත කර තිබූ ග්‍රිෂ්ම නිවාසයේ වහලය ඉදිකිරිම සඳහා පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදි රු. 3,690,356 ක මුදලක් ගෙවා තිබුණි. වසරක කාලයක් ඉකුත්විමට පෙර නිවාසයේ වහලය ගැලවී යාම හේතුවෙන් වැයකරන ලද මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

2.6 වාහන පාලනය

---

(අ) සභාව සතු වාහන 09 ක් සභාව වෙත ලැබුණු දින සිටම වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) විගණන නියැදි පරීක්ෂණයකට අනුව සභාව සතු වාහන 03ක් සභාවේ නිලධාරීන් සහ මන්ත්‍රීවරුන් විසින් සභාවේ අරමුණුවලට බැහැර කාර්යයන් සඳහා අවස්ථා 15කදී භාවිතා කර තිබූ බව අනාවරණය විය.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි හා 1646 නියමයන් අනුව සභාව සතු වාහන 17ක් සඳහා ලොග් පොත්වල සටහන් යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර වාහන 17ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) අනතුරට භාජනය වී තිබූ සභාව සතු අංක 52-0571 දරන වාහනය සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කල බවට අනාවරණය වී නොතිබූ අතර, නියමිත පරිදි පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන්ද නිශ්චය කර නොතිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට අනුව වන සම්පත් හා පාරිසරික අමාත්‍යවරයා විසින් නිකුත් කළ 2000 නොවැම්බර් 22 දිනැති අංක 1159/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ "අ" උපලේඛනයේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු ඝෝගාතකාගාරය සඳහා ජාතික පාරිසරික බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

---

(ආ) සමාලෝචිත වර්ෂය තුළ නාගරික සායන සඳහා මිලදීගෙන තිබූ රු.600,000 ක ඖෂධ ලැබීම් සහ ඊට අදාල නිකුත්කිරීම් කිසිවක් ලේඛනගත කර නොතිබුණි.

(ඇ) ජේම්ස් වීදියේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් කඩහිමියන්ගෙන් රු.3,000,000ක මුදලක් තැන්පතු වශයෙන් ලබාගෙන පුද්ගලික ඉංජිනේරු සමාගමකට 2005 වර්ෂයේදී ගෙවා තිබුණද, අදාළ ඉදිකිරීම් 2013 පෙබරවාරි මස අවසානය වන විටද සිදුකර නොතිබූ අතර, ඊට අදාළ තැන්පතු නිරවුල් කරද නොතිබුණි.

(ඈ) තැන්පත් කර වසර 02ක් ඉක්මවූ වටිනාකම රු.6,709,203ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඉ) මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 546.1 හා මධ්‍යම පළාත් සභාවේ අංකය ප්‍රධාන සීපීසී/පීඑස්/06/06/02සහ 2003 අප්‍රේල් 11 දිනැති ලිපිය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 53 දෙනෙකු විසින් සේවක ඇප තැන්පත් කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය.

------------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). අයවැය පාලනය

(ඇ). ආදායම් පරිපාලනය.

(ඈ). වාහන පාලනය.

(ඉ). කොන්ත්‍රාත් පාලනය.